# කොටින්ට තෑගි දෙන්නෝ

අශෝක හඳගම මහතා තම තුප්පහි සිනමාව ආරක්‍ෂා කරමින් ඉරිදා දිවයිනට එවූ ලිපියක් එහි පළ නොකිරීම ගැන චෝදනා කරමින් ඒ ලිපියම යැයි සිතිය හැකි ලිපියක් සති අන්ත පත්තර කඩමාල්ලකට යවා ඇත. තුප්පහියකු වූ සඳගමට පිළිතුරක් නොලිවුවහොත් ඔහු ඒනිමිත්ත කරගෙන සමාජයේ පොරක් ලෙස තව තවත් බැබලීමට උත්සාහ දරණු ඇත. එබැවින් තුප්පහි හඳගම (තුප්පහියන් හඳුනාගැනීමට පසුගිය සතියේ පළ වූ ලිපිය කියවන්න) කසිකබල් මාක්ස්වාදී ස්ථාවරයකින් ලියන ලද ලිපිය ඊනියා ප්‍රාග්ධනය ගැන කතාකරන පල්හෑල්ලක් වුවත් (සමහර විට ඉරිදා දිවයින එය පළ නොකෙළේ එය පල්හෑල්ලක නිසා විය හැකිය.) එයට පිළිතුරක් ලිවිය යුතුය. එමගින් අඩු තරමින් වෙනත් පාඨකයන් දැණුවත් කළ හැකිය. එහෙත් මේ එවැනි පිළිතුරක් නොව ඒ සඳහා කෙරෙන පූර්විකාවක් පමණකි. මේ සතියේ තෝකියෝ ණය කතා පිළිබඳවද යමක් කිව යුතුය. කොටින්ට තෑගි දෙන්නෝ හා හඳගමට තෑගි දෙන්නෝ එකම පිරිසක් වෙති. දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටින්නෝ හඳගමගේ තුප්පයි සිනමාව වෙනුවෙන්ද පෙනී සිටිති. හඳගම ද දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටියි. ඒ ගැන ද පසුව කතා කරමු.

බටහිර සංස්කෘතිය යටත් විජිතවාදයේ ඒජන්තයන් වූ හඳගම වැනි තුප්පහියන්ගේ බුද්ධිමට්ටම පිළිබඳ හොඳ අවබෝධයක් මට ඇත. මේ ඒජන්තයෝ කිසි දිනෙක බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට පටහැනිව යන කිසිවක් කිසි දිනෙක ඉගෙන නොගනිති. කසිකබල් මාක්ස්වාදය ගැන ඔවුන් අතනින් මෙතනින් කරුණු අහුලා ගනනේ ඒ කිසි දාක යල් පැන නොයන මාක්ස්වාදයද බටහිර සංස්කෘතික යටත් විජිතවාදයේම කොටසක් වන බැවිනි. යම් දැනුමක් යල් පැනීමට නම් ඒ දැනුම යම්කිසි කාලයක් තුළ වලංගු වී පැවතිය යුතුය. මාක්ස්වාදය යල් පැන නොයන්නෙ එය කිසි දිනෙක වලංගු නොවූ හා නොවන බැවිනි. මාක්ස්වාදයේ නමින් අවසන් වශයෙන් ගත් කල ප්‍රායෝගික වශයෙන් සිදු වී ඇත්තේ මිනී මැරීමය. ලෙනින් පිහිටු වූ රාජ්‍යය අවුරුදු හැත්තෑපහක් පමණ සුළු කාලයකින් පසුව කිසි දිනෙක යළි ස්ථාපිත නොකළ හැකි සේ බිඳී යෑමෙන්ම පෙන්නුම් කරන්නේ මාක්ස්වාසයම පල් හෑල්ලක් බවය. මාක්ස්වාදය ඊනියා අනාවැකි එල දැරීම කෙසේ වෙතත් කම්කරු පංතියකවත් බිහි වී නොමැත. මාක්ස්වාදී රාජ්‍යයක් ලොව කිසි තැනක කිසි දා බිහිවී නැත. ලෙනින් පිහිටුවූයේ මාක්ස්වාදී රජයක් නොව ලෙනින්වාදී රජයකි. හඳගම වැනි තුප්පහියන්ට මාක්ස්වාද හා ලෙනින්වාදය අතර වැනි වෙනස මා විසින් ලියන ලද මාක්ස්වාදයේ දරිද්‍රාතාවය හා වෙනත් ලිපි කියවා තේරුම් ගත හැකි වුවත් මාක්ස්වාදී අනුකාරකයෝ ඒ ලිපි කිසි දිනෙක අධ්‍යයනය නොකරති. එසේ කළහොත් ඔවුන්ගේ පෞරත්වයට කුමක් වේද?

තුප්පහි හඳගමගේ චිත්‍රපටි මම නොබලමි. මා කරන්නේ ඔහුගේ අහවල් චිත්‍රපටිය ගැන විචාරයක් නොව ඔහුගේ තුප්පහි චිත්‍රපටි කලාව ගැන සිංහල බෞද්ධ සිංහල සමාජ විද්‍යාත්මක ඇසකින් බැලීමය. චිත්‍රපටි නොබලා යමකුගේ චිත්‍රපටි කලාවේ සමාජ විද්‍යාව ගැන කතා කරන්නේ කෙසේදැයි බොරු පණ්ඩිතයකු ඇසීමට ඉඩ ඇත. එවැන්නනට කිව යුත්තේ උරුළෑවා ගිය මග දැන ගැනීමට ඌ සිපගත යුතු නොවේය යන්න පමණය. හඳගම වැනි බොරු ප්‍රබුද්ධයන් විශ්වවිද්‍යාල තුළ ද පළල් සමාජයේ ද හෙළිදරවු කළ යුතුය. මොහු පමණක් නොව ගනනාථ ඔබෙසේකරගේසිට එක්ස් කණ්ඩායම දක්වා සමාජයේ පොරවල් බවට පත් කෙරී ඇති බටහිර සංස්කෘතික යටත් විජිතවාදයේ ඒජන්තයන් නිරුවත් කළ යුතුය. ඔවුන්ගේ බොරු බුද්ධිමත්කමේ වෙස් මුහුණ ගලවා දැමිය යුතුය. ඉඩ ලැබෙන පරිදි අපි එය කරමු. අද අප වැනි රටවල ප්‍රධානම ප්‍රශ්නය වී ඇත්තේ බටහිර දැනුම ආධිපත්‍යය විසින් අප පෙළනු ලැබීමය. ඊනියා විද්‍යාව වේවා සිනමා විචාරය වේවා ඒ සියලු දැනුම්වල උල්පත ඇත්තේ බටහිරය. හඳගම වැනි බටහිර සංස්කෘතික යටත් විජිතවාදයේ ඒජන්තයන් තේරුම් නොගන්නවාට (ඔවුන් එය තේරුම් ගතහොත් ඔවුන්ගේ ඒජන්තකම ද පෞරත්වය ද ඒ සමඟ නැතිවෙයි.) ඒ සියලු දැනුම නිර්මාණය වන්නේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළය. එහි පදනම ඇත්තේ දෙවියන් වහන්සේ හා ලෝක නිර්මාණය, රේඛීය චින්තනය ඊනියා යථාර්ථය වැනි දෑය. හඳගම තම ඊනියා බෞද්ධකම ගැන දෙඩෙව්වද දෙවියන් වහන්සේ වෙනුවෙන් කඩේ යන්නෙකි. එසේ කඩේ යෑම වෙනුවෙන් ඔහුට තෑගි ද ලැබෙයි.

ඒ ඒ මිනිසුන්ගේ චින්තන වෙනස් බවත්, චින්තනය පවා කලින් කලට වෙනස් වන බවත් අවුරුදු දාහතක පමණ කාලයක් තිස්සේ අපි ප්‍රකාශ කරමු. එපමණක් නොව දැනුම නිර්මාණය වන්නේද යම් චින්තනයක් පදනම් කර ගනිමින් බව අපි පවසමු. අප භාවිතා කරන අර්ථයෙන් චින්තනය යනු සිතීම නොවේ. එය සුසමාදර්ශයට (පැරඩයිමය) වඩා පළල් සංස්කෘතියකි. අප සිතන්නේද චින්තනයක් තුළය. චින්තනය ගැන වැඩි විස්තර ජාතිය, චින්තනය හා සංස්කෘතිය සහ මගේ ලෝකය කෘතිවල ද වෙනත් ලිපිවෙල ද සඳහන් වෙයි. පසුගිය අවුරුදු දාහතක පමණ කාලයක් තුළ අපි අපේ දැනුමේ චින්තන පදනම අවබෝධ කර ගත්තෙමු. අපට දැන් සමාජයීය විද්‍යාවන්හි හා මානව ශාස්ත්‍රවල අපේ දැනුම

© Prof. Nalin De Silva

නිර්මාණය කළ හැකිය. අපි දැන් එය කරන්නෙමු. ඒ කෙෂ්ත්‍රවල බටහිර දැනුම දැන් අපට කිසිම වූ ආකාරයක අභියෝගයක් නෙවේ. ඒ සියළු කෙෂ්ත්‍රවල නිවන කේන්ද්‍රීය වූ අපේ දැනුම නිර්මාණය කරන්නේ කෙසේද යන්න ගැන අපට හොඳ අවබෝධයක් ඇත. දැන් කළ යුතුව ඇත්තේ තරුණ තරුණියන්ට දිරිමත කර බටහිර දැනුමට බාහිර වූ දැනමක් නිර්මාණය කිරීමට ඔවුනට ගුරුහරුකම් දීමය. චතුසකෝටිකයට ද හසු නොවන නිවන දැනුම නිර්මාණයේදී කේන්ද්‍රීය වන්නේ කෙසේදැයි වාර්ෂික මොනර රංගනයේ යෙදෙන සිරි ගුණසිංහ මහතාට හෝ වෙනත් අයකුට හෝ ප්‍රතිශතයක් වේනම් එයට පිළිතුරු දීමට ද අපි සූදානමින් සිටිමු. අපේ ප්‍රවාද ගොඩනගන ආකාරය පිළිබඳ ලිපි පෙළක් විද්‍යුසර පුවත්පතෙහි පළ වෙයි. චින්තනය යන්න අප යොදා ගන්නා සංකල්පීය අර්ථයෙන් නොවූවත මහාචාර්ය පී. බී. මීගස්කුඹුර මහතා විසින් පරිවර්තනය කරන ලද පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි නම් විශිෂ්ට කෘතියෙහි සිතීම යන අර්ථයෙන් විස්තර කෙරී ඇත. යම් ප්‍රමාණයකට භාෂාවෙන් චින්තනය නිරූපනය වන ආකාරයද එහි විස්තර කෙරී ඇත. හඳගමලා සිරිගුණසිංහලා පමණක් නොව ඊනියා පශ්චාත් නූතනවාදීන්ද දන්නේ දෙවියන් වහන්සේ හා යථාර්ථය සහිත චින්තනයක මත පදනම්ව බටහිරයන් නිර්මාණය කරන දැනුම අනුව සාහිත්‍යයෙහි සිනමාවෙහි බටහිර ප්‍රවාද (ප්‍රවාදයට ඉංගිරිසියෙන් කියන්නෙ තියරි කියාය. තියරි තීසීස් ආදි වචන වුවද තියලොජි හෙවත් දේවධර්මය ඇසුරු කොට නිපදවා ගත් දෑ බව වටහා ගත යුතුය.) තම ඊනියා නිර්මාණවල යොදා ගැනීමත් ඒවා ජනසමාජය තුළ ප්‍රචලිත කිරීමත්ය. මේ අනුකාරක තුප්පහියනට මෙරට බුද්ධිමතුන් යැයි බටහිරයෝ හා ඔවුනගේ අනුකාරකයෝ සහතික දෙති.

හඳගම කැලණිය විශ්වවිද්‍යාලයට නැවත වරක් ගෙන්වා ගැනීමට මම හැකි සෑම උත්සාහයක්ම දරමි. එවිට ඔහු සිසුන් ඉදිරිපිටදී ම නිරුවත් කළ හැකිය. අද පත්තර කඩමාල්ලක් හරහා සිංහයකු, නැත කොටියකු වීමට උත්සාහ දරන ඔහු ගියවර තනි තටුවෙන් කැලණියට පැමිණි අවස්ථාවේ හික්මීයකු ලෙස හැසිරුණු ආකාරය එදා එහි සිටියෝ දනිති. ජාතික චින්තනය ඇරඹි අවුරුදු දාහතකට පසු අපි අද ඉතාමත් ශක්තිමත් තැනක පසුවන්නෙමු. අද ජාතික චින්තනය මගින් ඉදිරිපත් කෙරෙන මතවාදවලට (දැනුම යනුද මතවාදයක් පමණක් බව කැලණිය විශ්වවිද්‍යාලයේ ඇතුගල මහතා ද නොදන්නා සේය. එහෙත් ඔහු ඉගෙන ගැනීමට සූදානම් යැයි මම සිතමි.) අභියෝග කිරීමට බටහිර නිපදවන මතවාදවලට නොහැකිය. හඳගම තම තුප්පහි බව හෙළි කරමින් මෙසේ කියා ඇත. "ප්‍රාග්ධනයේ තරකයට හසුනොවන, ඉන් විස්තර කළ නොහැකි කිසිදු විපර්යාසයක් ලෝකයේ සිද්ධ වෙන්නේ නැත. ප්‍රාග් ධනයේ තර්කයෙන් ස්වායත්ත වූ සංස්කෘතික ආක්‍රමණයක් අද ලොව කිසි තැනක සිදුවන්නේද නැත. සංස්කෘතිය ගලන්නේ ප්‍රාග්ධනය ගලන දිසානතිය ඔස්සේමය. "හඳගමගේ ලිපිය පළ කළ පත්තර කඩමාල්ලේ කසිකබල් පත්තරකාරයා ද මෙය වැදගත් කියමනක් ලෙස උපුටා දක්වා ඇත. හඳගමගේ ද පත්තරකාරයාගේ ද මුග්ධ බව ඉන් හෙළිදරව් වෙයි. (හඳගම වැන්නන් තර්කය යන වචනය යොදා ගන්නා ආකාරය පවා වැරැදිය.) මේ කියමන ගලා එන්නේ සියල්ල දෙවියන් වහන්සේට ඌනනය කරන යුදෙව් චින්තනය තුළිනි. හඳගම තමා බෞද්ධ යැයි කියමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කඩේ යන්නේ එපරිද්දෙන් පමණක් නොවේ. දරුණුම ඌනිතවාදියකු වූ මාක්ස් වත් මෙවැනි මුග්ධ කියමනක් කියා නැත. මේ ඉතාමත් ගොරහැඩි ඌනිතවාදයයි. බොරු විද්‍යා කතා ඇදබෑවද මාක්ස්ට තරමක සියුම් බවක් තිබිණි. එක්ස් කණ්ඩායමේ යැයි කිවහැකි කවුදෝ අපට ප්‍රාග්ධනය නොතේරෙන්නේ යැයි කියා තිබිණි. ප්‍රාග්ධනයෙහි තේරුම් ගන්නට තරම් දෙයක් නැත. සමහර විට එක්ස් කණ්ඩායමට නම් ප්‍රාග්ධනය තේරුම් ගැනීම මහත් අමාරු කාරණයක් වන්නට ඇත. අපි මේ සියල්ල පසුව කතා කරමු. සියල්ල ප්‍රාග්ධනයට ඌනනය කරමින් තුප්පහි අනුකාරකයන් කියන දෑ සුණු විසුණු කර දැමීම මහ කජ්ජක් නොවේ. එහෙත් දැන් තෝකියෝ සාකච්ඡා ගැන යමක් කිව යුතුය.

තෝකියෝහිදී ලංකාවට මහා විශාල ණය මුදලක් ලැබී ඇත. මේ ණය ඊනියා සංවර්ධන කටයුතු වෙනුවෙනි. මේ මුදලින් විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර තැනීමට ජනාධිපතිනියගේ ප්‍රියතම වචන කිහිපයක් යොදා ගන්නේ නම් සත පහක්වත් ලැබේවියැයි සිතිය නොහැකිය. වැඩි මුදලක් උතුරු හා නැගෙනහිර පලාත් සංවර්ධනය සඳහා යෙදවෙනු ඇත. ඒ ණය අප ආපසු ගෙවිය යුතුය. ආධාර ලෙස ලැබෙන ණයෙන් යම් මුදලක් කොටි සංවිධානයට තෑගි ලෙස දෙනු ඇත. ඒ මුදලින් කොටි කොත්තු රොටි කන්නේ යැයි අපි නොසිතමු. කොටි ණය කතාවලට නොගොස්ම තෑගි ලැබුහ. මේ ණය, ණයක් නොවන්නේ කොටින්ටය. ඔවුනට එය ආපසු ගෙවීමට සිදු නොවේ. එහෙත් ආණ්ඩුව නමින් පෙනී සිටින ආයතනයට කොටින්ට දෙන මුදල් ද ආපසු ගෙවීමට නොසිදුවනු ඇත.

ආම්ටේජ්ලා, අකාශිලා එකට ජීවත් වෙති. හඳගම වැන්නන්ද ඒ බව අමතක නොකළ යුතුය. කැලණිය විශ්වවිද්‍යාලයේදී ඔහුට තෑගි ලැබෙන්නේ බටහිර රටවලින් යැයි කී විට ඔහු ඉතා නිවට ලෙස කීවේ ජපානයෙන්ද ඔහුට තෑගි ලැබුණු බවය. ඔහුට තෑගි දුන්නෝ රනිල් වික්‍රමසිංහට හා ප්‍රභාකරන්ට ණය දෙති. අද ජපානයද භූගෝලයේදී කොහේ තිබුණ ද දේශපාලනයේදී බටහිර රටක් බව නොදන්නෝ හඳගම වැන්නෝම වෙති. තනි තටුවේ සහයට පැමිණි, තම විභාග සඳහා

© Prof. Nalin De Silva

එක්ස් කණ්ඩායමෙන් නිවාඩු ලැබ සිටින ධම්ම දිසානායක නමැත්තෙකු පසුගියදා ලෝක ගෝලයේ කරකැවීම තුළ සියලු රටවල් බටහිරට යන බවක් කියා තිබිණි. එක්ස් කණ්ඩායමේ මහදැනමුත්තන් මහා දාර්ශනිකයන් වශයෙන් අඳබාලයන් ඉදිරියේ පෙනී සිටියද ඔවුන් දන්නා ඉටිගෙඩි දර්ශනයක් නැත. බටහිර යනු විශ්වයේ නිශ්චිත දිශාවක් නොවේ. එහි නිරපේක්ෂ බවක් නැත. මේ පුද්ගලයාගේ තර්කය නිවැරැදි වන්නේ, එනම්, සියලු රටවල් බටහිරට යා හැක්කේ බටහිර නමින් නිරපේක්ෂ දිශාවක් ඇත්නම්ය. එහෙත් එවැනි නිරපේක්ෂකයක් නැත. විශ්වයේ ඈත ලක්ෂ්‍යයකට ගොස් එහිදී නැගෙනහිරත් බටහිරත් දැනගත හැකි නොවේ. බටහිර යනු සංස්කෘතික හෝ දේශපාලන වශයෙන් නොව භූගෝලීය වශයෙන් ගත් කල නම් පොළොවේ භ්‍රමණයට සාපේක්ෂව අර්ථ දැක්වෙන්නක් පමණකි. "එබැවින් මොහු කියන ආකාරයට ලංකාව බටහිරට යැමක් සිදු නොවේ. ලංකාව බටහිරට යන්නේ කිනම් පැයකදී දැයි මොහු අපට තම තකතීරු ඥානයෙන් හෝ කියා දෙන්නේද?

බටහිර රටවල් හිටි අඩියේ මෙතරම් මුදලක් ලංකාවට ණයට හෝ දෙන්නේ ඇයි? මේ ණය බොහෝ අර්ථවලින් ණයකි. ණය සමග උතුරු හා නැගෙනහිර පළාත් සඳහා පොරොන්දු වී ඇති අන්තර් පාලනය ගැට ගැසී ඇත. මේ ගැටගැසීම්වලින් හෙළිදරව් වන්නේ අද වුවද ඊනියා ආණ්ඩුව, බටහිරයන් හා කොටි අතර සහයෝගයක් ඇත්තේ අන්තර්වාර පාලනයක් ලබා දීමට බවය. පසුගිය මැතිවරණයේදී එජාපෙරමුණ ආදී පක්ෂ සමග කොටි සංවිධානය සම්බන්ධ වුයේ යම් ගිවිසුමකට අනුව බව අස්ගිරි මහානායක හිමි ඇතුළු පිරිස දැන්වත් පිළිගත යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අන්තර් පාලනයක් පාර්ලිමේන්තුව තුළින් ලබා ගත හැකි නොවේ. කොටි ඒ බව දනිති. එබැවින් හැකි සෑම දෙයක්ම පාර්ලිමේන්තුවෙන්ද ඉතිරිය පාර්ලිමේන්තුවට පිටින්ද ගැනීමට ඔවුහු උත්සාහ දරති. රනිල් වික්‍රමසිංහ, ආම්ටේජ් ඉදිරිපිට ප්‍රභාකරන්ට අන්තර්වාර පාලනයක් දීමට පොරොන්දු වී ඇත. එහෙත් ජනතාවට මේ පොරොන්දු සුන්නත් දූලි බවට පත් කළ හැකිය. ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ලියා දී ඇති නාට්‍ය පිටපතට අනුව තව වැඩි කලක් කොටි සංවිධානය ඊනියා සාම කතාවලට සහභාගි නොවී නොසිටිනු ඇත. කෙසේ හෝ මිනීමරු කොටි ණය කතාවලට සහභාගි නොවීම මුදල් ලබාගෙන ඇත.

ණය කතාවලට සහභාගි වූ අගමැති ඇතුළු පිරිසක් ජපානයේදී පහරදීමට ලක්වී ඇතැයි කියැවෙයි. ඒ පහර දුන්නේ ජවිපෙ හිතවතුන් යැයිද ඒ සමග සඳහන් වෙයි. ඒ කෙසේ වුවත් එහිදී අගමැතිවරයා පවසා ඇත්තේ ජ.වි. පෙරමුණට ප්‍රජාතන්ත්‍රවාදයට ඇතුළුවීමට දුන් ආකාරයට කොටින්ටද ඉඩ දිය යුතු බවය. එහෙත් අගමැතිවරයාගේ සංසන්දනය වැරැදිය. එදා ජවිපෙ තර්ජනයට එරෙහිව නැගී සිටියෝ බොහෝය. ජවිපෙ මර්දනය කරනු ලැබිණි. රෝහණ විජේවීර මහතා මරා දමනු ලැබුවේ අත්අඩංගුවේ සිටියදීය. ජ වි පෙරමුණේ ඇතැම් දෑ ගැන එකඟ නොවුවත් ආණ්ඩුව කළ කී දෑ ද වැරැදිය. එදා ජවිපෙ සමග ඊනියා සාමකතා නොවීය. අද සාමය ගැන කතා කරන ඔස්වල්ඩ් පර්ත් වැනි කතෝලික පූජකවරු එදා සිටියේ කොහේද?

ජවිපෙ ද මාක්ස්වාදය තුළ හිඳිමින් සැමට එක ලෙස සලකන බොරු කතාව කීවද එහි සාමාජිකයන්ගෙන් අති මහත් බහුතරය සිංහල බෞද්ධ වෙති. එදා කතෝලික පූජකවරු ඇතුළු පිරිස් සාමයක් ගැන කතා නොකෙළේ බහුතර ජවිපෙ සාමාජිකත්වය සිංහල බෞද්ධ වූ බැවින්ද? අද පූජකවරුන්ට අවශ්‍ය වන්නේ ක්‍රිස්තියානි මතවාදයක වූ කොටි ආරක්ෂා කර ඔවුන්ට උතුරු හා නැගෙනහිර පලාත්වල ආධිපත්‍යය ලබාදීමය. අගමැතිවරයා ජවිපෙ හා කොටි සංසන්දනය කිරීම වැරැදිය. ජවිපෙ මර්දනය කෙරුණු නමුත් ඊනියා ආණ්ඩුවට අද අවශ්‍ය වන්නේ කොටි මර්දනය නොකර සිටීම පමණක් නොවේ, උතුරු හා නැගෙනහිර පලාත් අවසානයේදී කොටි සංවිධානයට භාර දීමට ද ආණ්ඩුවට අවශ්‍ය වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva